# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
# பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு
# UNIVERSITY GRANTS COMMISSION

මගේ අංකය
எனது இலக்கம்
My Number } UGC/ HR/2/3/1

තැපැල් පෙට්ටිය
அஞ்சல் பெட்டி
Post Office Box } 1406

ඔබේ අංකය
உமது இலக்கம்
Your Number }

20, වෝඩ් පෙදෙස, කොළඹ 07, ශ්‍රී ලංකාව.
20, வாட்டு இடம், கொழும்பு 7, இலங்கை.
20, Ward Place, Colombo 07, Sri Lanka.


February 26, 2020

Vice Chancellors of Universities
Rectors of Campuses
Directors of Institutes

**OBTAINING INFORMATION ON PROGRAMMES PLANNED TO BE IMPLEMENTED IN MARCH, APRIL AND MAY 2020**

This refers to the instructions given by the Chairman of the Election Commission by his letter no. EC/EDR/PE/2020(INF) dated 05.02.2020 with regard to the above **(copy of the letter is enclosed herewith as Annex I).**

Accordingly, you are kindly informed to make necessary arrangements to send the required particulars of following programmes that you have planned to be implemented **in March, April, and May 2020**, in the given format of the annexed letter.

1. Recruitment / Promotions & Transfers
2. Public Ceremonies / Laying of the foundation stones and Opening Ceremonies
3. Development programs to be completed
4. New projects scheduled to start these months

I would be thankful if you could send the duly filled format of your University/ Campus/ Institute **on or before February 28, 2020 to reach the Additional Election Commissioner (Legal Investigations), Election Commission, Sarana Mawatha, Rajagiriya and by way of e-mail to electionedr@gmail.com** after being personally satisfied that information are true and in accordance with the annexed letter with copies to Secretary/Ministry of Higher Education, Technology & Innovations and Chairman/ UGC.

**Senior Prof. Sampath Amaratunge**
Chairman

Cc: Secretary/ Ministry of Higher Education, Technology & Innovations
Vice Chairman/ UGC
Secretary/ UGC


දුරකථනය / தொலைபேசி / Telephone } 2695301, 2695302, 2692357
ෆැක්ස් / பெக்ஸ் / Fax } 2688045
වෙබ් අඩවිය / வெப் தளம் / Website } http://www.ugc.ac.lk

Annex I

# මැතිවරණ කොමිෂන් සභාව
# தேர்தல்கள் ஆணைக்குழு


පොදු කාර්යාලය : 011-2868441, 2868442, 286844
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය,
සරණ මාවත, රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය : EC/EDR/PE/2020 (INF) | ඔබේ අංකය : | දිනය : 2020/02/05 |
| எனது இல. | உமது இல. | திகதி |

07 FEB 2020

10 FEB 2020

07 FEB 2020

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරුන් / පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ පළාත් පාලන කොමසාරිස්වරුන්/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් / සාමාන්‍යාධිකාරීවරුන්

2020 මාර්තු, අප්‍රේල් හා මැයි මාසයට අදාලව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති වැඩසටහන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ප්‍රතිපාදන අනුව 15 වැනි පාර්ලිමේන්තුව 2020 මාර්තු මස 01 වැනි දින සිට එළඹෙන ඕනෑම දිනයක දී විසුරුවා, නව පාර්ලිමේන්තුවක් වෙනුවෙන් මහමැතිවරණයක් ප්‍රකාශ කිරීමේ බලය ගරු ජනාධිපතිවරයා සතුය. එසේම 2020 මාර්තු 02 දින සිට පාර්ලිමේන්තුව අනිවාර්යයෙන්ම විසුරුවන බවටද දේශපාලන විචාරකයන් විසින් අදහස් ප්‍රකාශ කරන බව නිරීක්ෂණය වේ. ඒ අනුව ඡන්ද විමසීම් නිවේදනයක් නිකුත් කළ හැකි ආසන්න පූර්වයෙන් වූ කාලසීමාව තුළ ඒ සඳහා වන මූලික කටයුතු සංවිධානය මැතිවරණ කොමිෂන් සභාව විසින් මේ වන විට සිදුකරමින් පවතී.

02. මැතිවරණ කාල සීමාවක් ආරම්භ වූ පසු පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරඟ කරනු ලබන අපේක්ෂකයෙක්/ පක්ෂයක් හෝ කණ්ඩායමක් තෝරාගැනීම හෝ ප්‍රවර්ධන හෝ වළකාලීමේ කාර්යය සඳහා රාජ්‍ය දේපළ හෝ නිලධාරීන් භාවිත කිරීමෙන් වැළකී සිටිය යුතුය. එසේ හෙයින් හදිසියේ නිකුත් කරනු ලබන මැතිවරණ ප්‍රකාශයට පත් කිරීමේ නිවේදනයක් මඟින් එතෙක් සිදු කරගෙන එනු ලබන රජයේ සංවර්ධනමය කටයුතු හා අනෙකුත් බඳවා ගැනීම් හා උසස් කිරීම් ආදී කටයුතු අඩාල වන බවත්, එම කටයුතු සිදුකරගෙන යාමේ දී නීතිමය බාධා එල්ල වීම නිසා බොහෝ ගැටලු හා අපහසුතා එම කාර්යයන් මෙහෙයවන රාජ්‍ය නිළධාරීන් මෙන්ම මැතිවරණ නිලධාරීන්ද ලක්වන බව අපගේ අත්දැකීමයි.

03. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන ඉදිරියේ දී එළඹිය හැකි මැතිවරණ කාල සීමාවක් තුළ ඔබ අමාත්‍යාංශය හෝ ඒ යටතේ වන ආයතනයන් මඟින් සංවිධානය කරනු ලබන පහත කටයුතු සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව දැනුම්වත් වීම සඳහා, 2020 මාර්තු, අප්‍රේල් හා මැයි යන මාසයන්හි ඔබ විසින් සැලසුම් කර ඇති පහත කරුණු සම්බන්ධයෙන් වන විස්තර කඩිනමින් අප වෙත ලැබීමට සැලැස්වීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

1. බඳවාගැනීම්/ උසස් කිරීම් හා මාරු කිරීම්
2. රාජ්‍ය උත්සව/ මුල්ගල් තැබීම් හා විවෘත කිරීම්
3. වැඩ අවසන් වීමට නියමිත සංවර්ධන වැඩසටහන්, හා
4. මෙම මාසවල ආරම්භ වීමට යෝජිත නව ව්‍යාපෘති

04. එසේම මෙයට අමතර වශයෙන් ඔබ අමාත්‍යාංශය හෝ එහි ආයතන විසින් මාධ්‍ය සමඟ ප්‍රචාරණ කටයුතු සම්බන්ධයෙන් ගිවිසුම්ගත වීම, භාණ්ඩ බෙදාදීම හා වෙනත් මහජන දැනුවත් කිරීම හා සමුළු

පැවැත්වීම සම්බන්ධයෙන් ඔබගේ විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර මැතිවරණ සමය සමඟ නොගැටෙන ලෙස මෙවන් කටයුතු සංවිධානය කිරීම වඩාත් උචිත වේ.

05. ඉහත දක්වා ඇති තොරතුරු 2020 පෙබරවාරි මස 20 වැනි දින හෝ ඊට පෙර අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති විමර්ශන), මැතිවරණ කොමිෂන් සභාව, සරණ මාවත, රාජගිරිය නමට තැපැලෙන් හෝ electionedr@gmail.com යන ඊ-තැපැල මගින් මේ සමඟ අමුණා ඇති EC/EDR/PE/2020/INF/F ආකෘතියට අනුව ලැබීමට සලස්වන මෙන් දන්වා සිටිමි. මෙම තොරතුරු ලබා දීම එම වැඩසටහන් පවත්වාගෙන යෑමේ අවසරයක් ලෙස නොසැලකිය යුතු අතර මැතිවරණ ප්‍රකාශ කිරීමත් සමඟම මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව නිකුත් කරනු ලබන විධාන, චක්‍රලේඛ හා උපදෙස් වලට අනුව ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය බව අවධාරණය කරනු ලැබේ.

06. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ඔබ දක්වන සහය ඉතා අගය කොට සලකමි.

මහින්ද දේශප්‍රිය
සභාපති/ මැතිවරණ කොමිෂන් සභාව

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්,
4. පොලිස්පති/ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (මැතිවරණ)
5. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරින්

} කාරුණික දැන ගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා

6. දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් - දැන ගැනීම පිණිස හා මේ සම්බන්ධයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්/ සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්/ නාගරික කොමසාරිස්වරුන්/ නගර සභා හා ප්‍රාදේශීය සභා ලේකම්වරුන් දැනුම්වත් කර තොරතුරු ලබා ගැනීම වස්


සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
*e-mail : chairman@elections.gov.lk*

මැතිවරණ කොමසාරිස්/අධ්‍යක්ෂ ජනරාල්
*தேர்தல்கள் ஆணையாளர்/ பணிப்பாளர் நாயகம்*
දුරකථන/தொலைபேசி : 0112885207
ෆැක්ස්/தொலைநகல் : 0112885208
*e-mail : cge@elections.gov.lk*
*dgelection@elections.gov.lk*